"ඔව් ඉතින් ඔයාට කොයි වෙලාවේ බැලුවත් එක්කො පන්ති, නැත්නම් වැඩ... කෝල් එකක් දෙන්න තරම්වත් ඔයාට වෙලාවක් නැහැ..." අනෙක් පසින් කියුවණෝ කුමක්දැයි රිදීමා නොදත්තාය. ඇය දුටුවේ මහීකාගේ පැද්දෙන කකුලත්, නවාගත් හිසත් පමණෙකි. රාත්‍රී සීතල මකා ගැනීම සඳහා ඇය හැඳ සිටි රතු ජර්සියෙන් මහීකාගේ මුහුණේ පැහැය වැඩි වී ඇතැයි රිදීමා කල්පනා කළාය.

"හහ්....." මහීකා වහා අසුනින් නැගිට්ටේ, රිදීමාගේ දැහැන බිඳ දමමිනි.
"මොකක්ද ඔයා කීවේ ?" මහීකා දුරකථනයෙන් විමසුවාය.

"ගෑනුන්ට හිතක්, පපුවක් නෑ...." ඈ ඇසුවාය.
"ගෑනු හරි නපුරුයි.... එයාලට ඔයාලව තේරුම් ගන්න උවමනාවක් නෑ..." ඈ නැවතත් ඇසුවාය.

"අජය මේ ! අනෙක් ගෑනු ගැන නම් මම දන්නේ නැහැ..... හැබැයි මම නම් ඒ වගේ කෙනෙක් නෙවි. මම ඉවසන තරම මේ ලෝකේ කිසිම කෙනෙක් ඉවසන එකක් නෑ. ඔයා මට කතා නොකර ඉන්න කියනවා නම් මම කතා නොකර ඉන්නම්. මට කිසිම ප්‍රශ්නයක් නෑ. මම නපුරුයි කියලා හිතුවත්, මට ප්‍රශ්නයක් නෑ...."
ඈ තරහින් දුරකතනය විසන්ධි කළාය.

"හහ්....." රිදීමා යළිත් තම හිස දෑත මත ඔබා ගත්තාය.

"ආදරේ ! ආදරේ....." ඈ සිතුවාය.
"මෙච්චර හිත රිද්දගන්න ආදරේ කරන්න ඕනද ?"

"ආදරේ තමා මේ ලෝකේ ගෙනියන්නේ ! ආදරේ නැත්නම් ජීවිතයකුත් නැහැ "
තණගොල්ලේ වැතිර සිටි තරුණිය, තරුණයාට පැවසුවාය. තරුණයාගේ මුහුණේ මන්දස්මිතයක් නැගෙනු ඈ දුටුවාය.
තරුණියගේ බොකුටු කෙස්කළඹ තදට ගොතා තිබුණෝය. තරුණිය, තම හීන් රන් වළලු දැමූ අතකින් එය පිරි මැද්දාය.
රිදීමාට ඉබේටම තම හිස අත ගෑ උණෝය. අම්මා කෙතරම් තදින් ඒ බොකුටු කොණ්ඩය ගොතන්නේද? එහි රැළි බුරුල් හැර, තදට කොණ්ඩා කරල් දෙකක් ගොතා සුදු රිබන් පටි ගැට ගසනවාද ?

ඈ තම සුරත දෙස බැලුවාය.
"ඒ හීන් රන් වළලු දෙක කෝ ?"
ඇගෙ දෑත හිස් ය.

තමා විදේශයකට එන නිසා අම්මා එය අරන් තැබුවාද ?

ඈ සෙමින් තම ගෙල අතගෑවාය. අගේ ගෙල වටා වූ සිහින් රන් මාලය ඒලෙසම තිබුණෝය. ඈ යළිත් තම හිස, සෙමෙන් අතගෑවාය. අර බොකුටු කොණ්ඩය, අම්මා තදින් පීරු අන්දම ඇයට යළි, යළිත් සිහිවන්නේ ඇයි ? සුදු චීත්ත පටි බැඳි කොණ්ඩා කරල් දෙකක්, ලේස් තදින් ගැට ගැසූ සුදු සපත්තුත් මෙතරම් තදින් සිහිපත් වන්නේ ඇයි ?
අනතුරුව ඇයතම සුරත දිගු කළාය. තමා රන් වළලු දෙකක් දමා සිටි බවට හෝඩුවා-වක්වත් තමාට නොදැනෙන්නේ අයි ?

"රිදීමා....."
ඇය, තිගැස්සි හැරී බැලුවාය.
"ඔයා මොනවද ඔයකරන්නේ ?" ඒ මහීකාය.
"මගේ අතේ තිබුණ වළලු දෙක කෝ කියලා කල්පනා කළා...."

මහීකාගේ මුහුණෙහි වූ තරහව ක්‍රමයෙන් අඩු වී යනු ඇයට පෙනුණෝය.
"මම හරි නරකයි නේද ?" ඇය ඇසුවාය.
"ඇයි ?"

"ඔයාට මෙච්චර කරදරයක් තියෙද්දි, මම මේ කොහෙවත් යන කොල්ලෙක් ගැන හිත, හිතා ඉන්න නිසා..."
රිදීමාට සිනා පහළවූයේය.

"ඒකට කමක් නෑ මහීකා...." මහීකා යළිත් කල්පනාවෙහි නිමග්නය වූවාය.
"ගෑනු හරි මෝඩයි නේද ?"

"කා ගැනද ඔය කියන්නෙ ?" රිදීමා ඇසුවේ යළිත් මහීකා හිනස්සවමිනි.
"ඔයා ගැන කියන්න මම දන්නේ නෑ. ඒත් මම නම් මෝඩ නෑ..."

"මම නම් හරිම මෝඩ වැඩක් කළේ මේ අජයකුට කැමැත්ත දීලා" මහීකා තැවුණාය.

"පිරිමි කියන්නේ මහ අමුතු ජාතියක්. එයාලට වෙලාවට එයාලගේ හැම වැඩක්ම කෙරෙන්න ඕනේ.... ගෑනු අපි, අපේ හැම වැඩක්ම පැත්තනට දාලා එයාලා දිහා බලාගෙන ඉන්න ඕන.... ගෑනු හරි මෝඩයි නේද ?"

"අනිවාර්යෙන්ම....." රිදීමා පැවසුවාය.
"මට තේරෙන්නේ නැහැ ඒ බව දැන දැනම ඇයි ගෑනු අමාරුවෙ වැටෙන්නේ කියලා...." මහීකා මඳක් කල්පනා කළාය.

"ඒත් එක අතකට මට දුකක් හිතෙනවා...."
"කවුරු ගැනද ?" රිදීමා විමසුවාය.
"අජය ගැන ?"

"ඇයි ?"
"එයා පව් අනේ.... හරියට කනවද දන්නෙත් නෑ. බොනවද දන්නෙත් නෑ....." මහීකා මඳක් කල්පනා කළාය.

"බොනවා නම් ඇති...." රිදිමා සිනාසුණාය.
ඇයට පෝනිටේලය දැමූ තරුණයා සිහිවිය. ඔහු ඉන්නේ කොහේ ද? ඔහු රැකියාවක් කරනවාද ? මහීකා අසන්නාක් මෙන් ඔහු කන්නේ, බොන්නේ කෙසේද ? ඇගේ සිතෙහි උපන්නේද කනගාටුවකි.
ඊළඟට ඈ, ඔහුගේ අවඥා සහගත සිනහව දුටුවාය.

"මේ කරදරයෙන් මම ගැලවෙන්නේ කවදාද ?" ඈ සුසමක් හෙලා, තමන්ගෙන්ම අසා ගත්තාය.

**මතු සම්බන්ධයි**


## කාමරයක් කුලියට දීමට

**ලේලෝ - Lalor**

**නිවසින් වෙන්ව පිහිටි, බාහිරින් ඇතුල් විය හැකි, නාන කාමරය සහිත සියලු පහසුකම් ඇති කාමරයක් (Granny Flat) කුලියට දීමට තිබේ**

**බිල් සමග සතියකට ඩොලර් 130 කි**

**විමසන්න**

**සූරිය මාකටිං සර්විසස් 9465 8257/0413 829 370**







